ප්‍රවෘත්තියක් පළ කිරීමේදී ඊට අදාළ සිරස්තලය තීරණය කිරීමෙහි ලා මාධ්‍යවේදියෙකුට නිර්මාණශීලී වීමේ අවකාශයක් පවතී. කෙසේ වෙතත් එහි සීමාව තීරණය වන්නේ අදාළ සිරස්තලය නිරවද්‍ය වීම, අන්තර්ගතය හා ගැලපීම සහ පාඨකයාව නොමග යවන සුළු නොවීම මත වේ.

මේ සඳහා උදාහරණයක් ලෙසින් අරුණ පුවත්පතේ මෙම පුවත ගත හැක. මෙහි අන්තර්ගතයේ සඳහන් වන්නේ "මහ මැතිවරණය මැයි මස අවසන් සතියේ දිනක පැවැත්විය හැකිදැයි යන්න තීරණය කිරීම සඳහා අද ජාතික මැතිවරණ කොමිෂන් සභාව විශේෂ සාකච්ඡා වට කීපයක් පැවැත්වීමට නියමිතය" යන්නයි. එනම්, මහ මැතිවරණය මැයි මස අවසන් සතියේ දිනක පැවැත්වීමට ඇති හැකියාව තවමත් තීරණය වී නැත. එසේ වුවත් සිරස්තලයෙන් පැවසෙන්නේ "මහ මැතිවරණය මැයි අගදී, අවසන් තීරණය අද" යනුවෙනි. එනම් සිරස්තලයෙන් ගම්‍ය කෙරෙනා අදහස වන්නේ මැයි මස අග මහ මැතිවරණය පැවැත්වීමට පූර්ව තීරණයක් ගෙන ඇති බවත්, එය අවසන් වශයෙන් තීරණය කිරීම අද සිදුවන බවත් වේ. බැලූ බැල්මට නොපෙනුණද, මෙම සිරස්තලයෙන් ගම්‍ය වන්නේ පුවතේ අන්තර්ගතයේ අඩංගු අදහස නොවේ.

මෙය එතරම් බැරෑරුම් වෙනසක් නොවේ යැයි යමෙකු පැවසීමට හැකියාව ඇතත්, අප සිහිතබා ගත යුත්තේ රටක මැතිවරණය පැවැත්වීම වැනි බරපතළ කරුණක් සම්බන්ධයෙන් පූර්ණ නිරවද්‍යතාවයකින් යුතුව වාර්තා කිරීම අත්‍යාවශ්‍ය බවයි. වෙසෙසින්ම මැතිවරණ දිනය තීන්දු වී නොමැති මොහොතක එය තීන්දු වී ඇති බව හැඟවෙන සිරස්තලයක් ප්‍රකාශ කිරීම ගැටළුකාරී වේ. එසේම එය මාධ්‍ය ආචාර ධර්මයන්ටද අනුකූල නොවේ.

**#MediaEthicsSL #lka #SinhalaPress #News #COVID19 #Coronavirus #Aruna**